

# ශ්‍රී ලංකාවට ඉදිරි කාලයේ ඇතිවන
# ශුභ අශුභ ග්‍රහ බලපෑම්

ආයුර්වේද හා ජ්‍යොතිෂ විශාරද
**ආයුර්වේද වෛද්‍ය ස්ටැන්ලි ධර්මකුමාර**

ශ්‍රී ලංකාව ලෝකයේ ඉතාම වාසනාවන්ත රටකි. හේතුව මුලු වර්ෂය පුරාම තද උණුසමක් හෝ තද සීතලක් නොමැතිව මෙහි ජීවත්වන මනුෂ්‍යයාටද, සතුන්ට ද, ගහකොළ වලට ද, කිසිම තදබල පීඩනයක් නොවනු ඇත. එය එකම දේශගුණයක් ඇති ලෝකයේ එකම රට වීමයි. අනෙක් ලොවේ සියලුම රටවල් කලකට ඉතා උණුසුම් දේශගුණයන්ද විටක ඉතා සීතල දේශගුණයක් ද පවතී.

අප ශ්‍රී ලංකාව ජ්‍යෝතිෂ අනුව කුම්භ ලග්නයට අයිති රටකි. කුම්භ ලග්නයට බලවත් ග්‍රහතුමා සෙනසුරුය. සෙනසුරු ග්‍රහයාගේ ගතගුණ ගත්කල නිතර නිතර ශුභ, අශුභ, ගෙනදෙන ලක්ෂණ පිහිටයි. තවද ශ්‍රී ලංකාවේ භූමියට ආදරය කරන, ගහකොළ, කුඹුරු, වැව්, ගංගා, රක්ෂිත කැලෑව, මුහුද හා මුහුදු තීරය, උස් කඳු, වනගත සතුන් හා දුගී දුප්පත් අසරණ මනුෂ්‍යයාට පිහිට වන හා ආරක්ෂාව සලසන බලවත් ග්‍රහතුමා සෙනසුරුය.2020 ජනවාරි මස 24 පසු ශ්‍රී ලංකාවට සෙනසුරු ග්‍රහ ගමන පැමිණේ. තවද 1947 සිට 1957 දක්වා වූ කාලපරිච්ඡේදයේ ද මෙවැනි ග්‍රහ ගමනක් ශ්‍රී ලංකාව තුල බල පැවැත්වීම නිසා මේ කාලවකවානුව තුල රටේ කෘෂිකර්මාන්තය ඉතා දියුණුවට පත්වී රට සහලින් ස්වයංපෝෂිත වී, දුගී දුප්පත් අසරණ මනුෂ්‍යයාට ඉතා ශුභ කාලයක් ලැබීය.

ආගම ධර්මයට ලැදිවීම, සාපරාධී ක්‍රියා දුරලීම, සොර සතුරු බය නොමැති වීම, තමාට ලැබෙන දෙයින් තම වත්තේ පිටියේ තිබෙන එළවලු, පලතුරු හා අනෙකුත් අත්‍යවශ්‍ය ආහාර තමා විසින්ම නිපදවාගෙන ගවයා, එලුවා, හා අනෙකුත් සත්වයන්ගේ ආරක්ෂාවද සලසා දෙමින්, කිරි ලබාගනිමින්, දරු දැරියන්ද නිරෝගී භාවයට පත් කළ බව ඉතිහාසයේ දැකිය හැකි විය. මේ ග්‍රහ ගමන සමඟ මානසික සුවයද, හික්මීමද , අවංකභාවයද, ගුරු සැලකිලි භාවය ද, ලැබීම නිසා මනුෂ්‍යයා දිගුකල් ජීවත් විය. 1948 පෙබරවාරි මස 4 වන විදේශ ආරක-වලින් මිදී අප ශ්‍රී ලංකාවට සම්පූර්ණ නිදහස ලැබුණි මෙකල ගමන් කලේද සෙනසුරු ග්‍රහ ගමනකි.

එකල ශ්‍රී ලංකාවේ බලයට පත් වූ අග්‍රාමාත්‍ය වරුන් මැති ඇමති වරුන් හා අග්‍රාණ්ඩුකාරවරුන් හා රාජ්‍ය නිලධාරීන් රටේ පාරම්පරික ධනවතුන් හා බුද්ධිමතුන්ය. ඔවන්ට තමාගේම වතුපිටි, කුඹුරු, ඇතුන්, තැන්පත් ධනය, හා දේශ දේශාන්තර වල උසස් අධ්‍යාපනය ලැබූ ප්‍රබල අවංක උගතුන්ය. ඔවුන් නිතරම නම්බුව ආරක්ෂාකරගනිමින් තම ධනය දුපුපත් ජනයාට පරිත්‍යාග කරමින් හා තම වතුපිටි දුගී දුප්පත් අයට දෙමින් මහජනයාගේ සුභ සිද්ධියට සේවයට කැප වූ ඉතා පිංවත් පාලකයන්ය.

1948 සිට 1957 දක්වා වූ කාලය තුල ශ්‍රී ලංකාවේ, මහාමාර්ග පද්ධතිය, ගංගා, සංචාරක හෝටල්, දුම්රිය මාර්ග, ඉතා විශාල , කර්මාන්තශාලා , කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ නව ක්‍රමවේ ද, අධ්‍යාපනික විප්ලවය, රැකියා ලාභ, ගොඩනැගිලි කර්මාන්තය, ධීවර කර්මාන්තය හා රාජ්‍ය පරිපාලන යාන්ත්‍රණය ද ඉතා ප්‍රචලිත ලෙස දියුණු කළහ. මෙකල රටට අවශ්‍ය සහල්, එළවලු , සත්ව ආහාර හා ශාඛ ආහාර බෙහෙත් අප රටේම නිෂ්පාදනය කළහ. මුලු රටේ ජනයාටම තුන්වේලක ආහාරයට ගැනීමට තරම් සහල් වලින් රට ස්වයංපෝෂිත විය. කිසිම මුදලක් පොදු ජනයාටද රටට ද අසල්වැසියාට ද ණය නොවීය. ශ්‍රී ලංකාව ද ලොව කිසිම රටකට සතයකින්වත් ණය නොවීය.

තමාට හැකි අන්දමින් ණයක් නැතිව බියකින් තොරව එකිනෙකා විසින් බෙදා හදාගෙන ජීවත් විය. දරුපවුලක දරුවන් 7 හෝ 10 ක් එකල සිටියත් ඉතා හොඳ මානසික සුවයෙන් හා නිරෝගීභාවයෙන් ජීවත් විය. කාන්තාවන් ගෙදර දොර දරුමල්ලන් පෝෂණය කරමින් ගෙදර දොර හා වතුපිටිවල කාර්යය යෙදීය. පුරුෂයන් ගමේ, රටේ රැකියාව කරමින් හරිහම්බකරගත් ධනයෙන් හැකි පමණින් සතුටින් ජීවත් විය. සොරසතුරු බිය නැත. විවාහ ජීවිතයද මිය යනතුරු රැකීය. දික්කසාද නැත. ප්‍රදේශයක ධනවතුන් කීප-දෙනෙකි. එහෙත් දුප්පතුන් කියා මනුෂ්‍යයන් සිටියේ නැත. සිතින් ගතින් පොහොසත් ය. මෙකල රාජ්‍යය පාලකයන් පූජා භූමි, නටබුන්, වෙහෙර විහාර, කෝවිල් ජ්ලි රාජ්‍ය අනුග්‍රහය ලබන පූජනීය ප්‍රදේශ ලෙස නම් කර ඒවා ආගමික සාසනයට පූජා කළහ. පූජක පක්ෂයට ඉතා ගරු නම්බු දී දේවත්වයෙන් සැලකීය. අනුශාසනා ලැබීය.

1957 සිට 1965 දක්වා කාලය තුල මුලු රටම සහලින් හා කෘෂිකර්මාන්තයෙන් හා යාන්ත්‍රික කර්මාන්තයෙන් ද ඉතා දියුණු විය. කිසිම ආහාරයක් විදේශයෙන් ආනයන නොකළහ. ඉතාම ධාර්මික අවංක රාජ්‍ය පාලකයන් විසින් රට පාලනය කළහ. 1965 පසු ක්‍රම ක්‍රමයෙන් පාලනය කළ අගමැතිවරු, ඇමතිවරු හා රාජ්‍ය පාලක-යන් නැවතත් විදේශ රටවල බලපෑම්වලට යටවී අප රටේ ලංකාව නැමති නාමය ද වෙනස් කර ශ්‍රී ලංකාව නමින් ප්‍රසිද්ධ කර රටේ නීතිය ද, ව්වස්ථාවද, බලය බෙදා-හැරීම් ද , රටේ දේශපාලන ව්‍යුහයද, අධ්‍යාපන ක්‍රම ද, විදේශ විනිමය ද, ණය බර ද, ආනයන අපනයන ක්‍රම ද, විදේශ රැකියා ද, මත්පැන්, සූදු, දුරාචාර, කෙලසන ක්‍රමවේදින් හඳුන්වා දෙමින් ස්වභාවික භූමිය හා සදාචාරය විනාශ කරමින් ඉතා දුප්පත් මිනිසා සිට ධනවතා දක්වා පවුල් 3-4 ක් මඟින් විනාශ කර අප මහා වසර 30 ක කුරිරු යුද්ධයකට ඇද දමමින් ජාතීන් බේද බින්න කරමින් මුලු රටම අගාතයට දැමීය. දැන් අපි බලමු 2020.1.24 පසු සෙනසුරු ග්‍රහතුමා මකර රාශියට පැමිණීමෙන් ඇති-වන ප්‍රතිඵලය ලෝකයේ වැඩිම දිනපතාම බුදු දහම බුද්ධ පූජාව පූජා කරන රටය. මුලු රටම දිනපතාම පිරිත්, බණ, භාවනා, අසන රටය. පූජනීය ස්ථාන 30000 කි. බුද්ධ පුත්‍රයන් 41000 කි. ආගමික නායකයන් මුස්ලිම් පූජකවරු හා සාමිවරු විසින් ද උදේ සිට රාත්‍රි වනතුරු ශබ්ධ නඟා රටටම ඇසෙන ලෙස ශෝත්‍ර කියති. වසර 5000 ක සිට කලින් කලට විදේශ ආක්‍රමණ පැමිණියත් බුදුන් වැඩි භූමියත් නිසා කෙසේ හෝ රට බේරී ඇත. එම පින් බලය 2020 පසු ශ්‍රී ලංකාව හිමි වෙනු ඇත.

2020 පසු පත්වන ජනාධිපති, අගමැති හා තරුණ මැති ඇමතිවරුන් ද පසුගිය කාලයේ තිබූ රටේ විනාශය දැක ඉතා දුර දක්නා ඥාණයෙන් පූජක පක්ෂයේ අනුග්‍රහය ද ලබමින් රට පාලනය කරනු ඇත. භූමියට අරක් ගත් සෙනසුරු ග්‍රහතුමා විසින් ඉදිරි වසර 10 තුල රටේ කුඹුරු එලිපෙහෙලි කර සහල් පලදාව වැඩි කිරීමෙන් සහල් මිල පහල වැටීම, එලවලු, පලතුරු හා කොළ වර්ග සාධාරණ මිලට ලබාගැනීමට හැකි වීම.

දුගී දුප්පත් ජනයාට රජයෙන් දෙන ආධාර හා ප්‍රතිලාභ වැඩි වීම විදේශ රසායන ද්‍රව්‍ය අඩංගු ශරීරයට අහිතකර ඖෂධ වර්ග තහනම් කර දේශීය ආයුර්වේද ඖෂධ මඟින් රෝගීන්ට ප්‍රතිකාර කිරීමට සැලසීම, නීතිය අකුරටම පිළිපැදීම, සතුරු කරදර , දුෂණ, මත්ද්‍රව්‍ය, නීති විරෝධී ක්‍රියා සියල්ලම තහනම් කිරීමට ද පෙලෙබේ. ආනයන අපනයන අඩු කර රටේ කර්මාන්ත ආයතන ආරම්භ කර විවිධ යන්ත්‍රපරණ නිපදවීම. සෞඛ්‍ය තාවය දියුණු කිරීම හා අධ්‍යයන රටාවද රටට අවශ්‍ය පරිදි දියුණුකර රැකියා ප්‍රශ්ණය විසඳීමටද උත්සාහ කරයි. අමතර ආදායම් ලබමින් නීති විරෝධී කටයුතු වල යෙදෙන අයට දැඩි දඬුවම් දීමට අමතරව මරණීය දණ්ඩනයද ක්‍රියාත්මක කිරීමට යොමු වේ.

විදේශ ණය බර වසර 10 තුල ඉතා ක්‍රමවත්ව අඩු කර රටේ දේශීය ආදායම ඉහළ යනු ඇත. මුලු රටේම ඉඩකඩම් මිල ඉතා ක්‍රමවත්ව ඉහළ යනු ඇත. විදේශ සංචාරක ව්‍යාපාරය 80 % කින් ඉහළ යනු ඇත. උගත් බුද්ධිමත් දරුවන් බිහිවීම හා නව තාක්ෂණික ක්‍රම දියුණු කර ලොවට අලෙවි කරනු ඇත. මුලු ශ්‍රී ලාංකිකයන්ට ම ආගම ධර්මයට ලැදි මානසික සුවය ලබන ගුණ ගරුක පුද්ගලයන් බවට පත්වන අතර තම පවුල් ජීවිතයද සාර්ථක වනු ඇත.

ලොව සිටින අප ශ්‍රී ලාංකකියන් ඉදිරි 10 වසර තුල විශාල වශයෙන් නැවතත් ශ්‍රී ලංකාවේ පදිංචියට පැමිණෙනු ඇත. මේ සියලු දේම ඉටු වීමට අවශ්‍ය ධාර්මික පාලකයෙකු මෙවර ජනාධිපති ඡන්දයෙන් පත්විය යුතුව ඇත. දුප්පතාගේ දුක හඳුනන ශ්‍රී ලංකාවට ආදරය කරන පංචශීලය රකින මානසික සුවයෙන් දියුණු පාලකයෙකු පහල වේවා..




